27 · 07 · 2016

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2016
## පුරවැසි අධ්‍යාපනය I , II

කාලය පැය 03 යි.

විභාග අංකය: ..........................................

10 ශ්‍රේණිය | I කොටස

**උපදෙස්**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. "ජනතාව විසින් ජනතාව උදෙසා පවත්වාගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවා දී පාලන ක්‍රමයයි." මෙම ප්‍රකාශය කරන ලද්දේ,
    (1) සීලර් විසිනි. (2) එබ්‍රහම් ලින්කන් විසිනි.
    (3) ඇරිස්ටෝටල් විසිනි. (4) ජී.ඩී.එච්. කෝල් විසිනි.

02. ඒක පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටකි.
    (1) ශ්‍රී ලංකාව (2) ඉන්දියාව
    (3) මහා බ්‍රිතාන්‍ය (4) චීනය

03. ශ්‍රී ලංකාව මැතිවරණ කොට්ඨාසවලට බෙදා වෙන් කිරීමේ දී සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන නිර්ණායක වනුයේ,
    (1) භූමිය හා ජන වර්ගයයි. (2) භූමිය හා ආගමයි.
    (3) භූමිය හා ජනගහනයයි. (4) ජනගහනය හා ආගමයි.

04. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක දේශපාලන විධායකය වනුයේ,
    (1) ජනාධිපති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයයි. (2) ජනාධිපති හා අගමැතියි.
    (3) අගමැති ප්‍රමුඛ පාර්ලිමේන්තු මන්ත්‍රීන් ය. (4) අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයයි.

05. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අටවන උප ලේඛනයට අනුව ශ්‍රී ලංකාවේ පළාත් ගණන,
    (1) 8 කි. (2) 9 කි.
    (3) 10 කි. (4) 25 කි.

06. පළාත් ආණ්ඩුකාරවරයෙකුගේ නිල කාලය ලෙස සැලකෙන්නේ,
    (1) වසර 03 කි. (2) වසර 04 කි.
    (3) වසර 05 කි. (4) වසර 06 කි.

07. ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතල වනුයේ,
    (1) බදු පැනවීම හා රැස් කිරීම වේ. (2) අධ්‍යාපනය වේ.
    (3) සෞඛ්‍ය වේ. (4) නිවාස හා ඉදිකිරීම් වේ.

08. තල දෙකක ආණ්ඩු ක්‍රියාත්මක වන පාලන ක්‍රමය හඳුන්වනුයේ,
    (1) සන්ධිය රාජ්‍ය ලෙසිනි. (2) ඒකීය රාජ්‍ය ලෙසිනි.
    (3) ජාතික රාජ්‍ය ලෙසිනි. (4) රාජාණ්ඩු ලෙසිනි.

09. ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවීම සිදුවනුයේ,
(1) 1865 දී මහ නගර සභා ආඥා පණත සම්මත කිරීමත් සමග ය.
(2) 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ සමග ය.
(3) 1972 පළමු ජනරජ ව්‍යවස්ථාවත් සමග ය.
(4) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය හා 1987 අංක 42 දරණ පාර්ලිමේන්තු පණත මගින් ය.

10. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතනවල ප්‍රධාන නිලධාරී තනතුරකි.
(1) කථානායක තනතුර (2) නීතිපති තනතුර
(3) ආණ්ඩුකාර තනතුර (4) නගරාධිපති තනතුර

11. වර්තමාන ලෝකයේ බොහොමයක් රටවල් පාලනය සඳහා යොදාගෙන ඇත්තේ,
(1) ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ක්‍රමයයි. (2) රාජාණ්ඩු පාලන ක්‍රමයයි.
(3) රදළ ආණ්ඩු පාලන ක්‍රමයයි. (4) වැඩ වසම් පාලන ක්‍රමයයි.

12. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පක්ෂ ක්‍රමය වනුයේ,
(1) ඒක පක්ෂ ක්‍රමයයි. (2) ද්වි පක්ෂ ක්‍රමයයි.
(3) බහු පක්ෂ ක්‍රමයයි. (4) ඉහත කිසිවක් නොවේ.

13. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක විධායකයේ ප්‍රධානියා වනුයේ,
(1) ජනාධිපති ය. (2) අගමැති ය
(3) කථානායක ය (4) ඔම්බුඩ්ස්මන් ය.

14. රට තුළ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩු කැන්ටන් ලෙස හඳුන්වනුයේ,
(1) ඉන්දියාවේ ය. (2) මහා බ්‍රිතාන්‍යයේ ය.
(3) ප්‍රංශයේ ය. (4) ස්විස්ටර්ලන්තයේ ය.

15. මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාවලට සමසේ භුක්ති විඳීමට හැකි බලතල අයත් ලැයිස්තුව වනුයේ,
(1) විවෘත ලැයිස්තුව යි. (2) සමගාමී ලැයිස්තුව යි
(3) සංවෘත ලැයිස්තුව යි (4) විවෘත හා සමගාමී ලැයිස්තුව යි.

16. මහා මැතිවරණය මගින් නියෝජිතයින් තෝරා පත් කර ගැනීම සිදු කරනු ලබන්නේ,
(1) ව්‍යවස්ථාදායකය සඳහායි. (2) විධායකය සඳහායි.
(3) පළාත් සභා සඳහායි. (4) ප්‍රාදේශීය සභා සඳහායි.

17. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රමය වනුයේ,
(1) ඒකීය ආණ්ඩු ක්‍රමයයි. (2) සන්ධීය ආණ්ඩු ක්‍රමයයි.
(3) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය යි. (4) සන්ධීය රාජ්‍ය ක්‍රමයයි.

18. මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණ කටයුතු කරන්නේ,
(1) මහා ඇමති විසිනි. (2) නගරාධිපති විසිනි.
(3) අගමැති විසිනි. (4) ආණ්ඩුකාරයා විසිනි.

19. ඉතා සංකීර්ණ වූ බහු සංස්කෘතික රටකි.
(1) චීනය (2) ශ්‍රී ලංකාව
(3) මහා බ්‍රිතාන්‍ය (4) ඉන්දියාව

27.07.2016
පූර්වාංක ...
10 ශ්‍රේණිය

Learning Resource Center
R
De Mazenod College
Kandana

20. ශ්‍රී ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක ගණන
(1) 20 කි. (2) 22 කි.
(3) 23 කි. (4) 25 කි.

21. බහු සංස්කෘතික සමාජයක සහජීවනයෙන් කටයුතු කිරීම වඩා වැදගත් වීමට හේතුව කුමක් ද?
(1) ජාතීන් අතර සහජීවනය ඇති කිරීම. (2) අනෙකුත් රාජ්‍යයන්ට ගරු කළ හැකිවීම.
(3) විදේශ රාජ්‍යයන්ට උදව් කළ හැකි වීම. (4) ජාතියක් ලෙස නැගී සිටීමට හැකි වීම.

22. නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමේ දී සැලකිය යුතු වැදගත් කරුණක් වනුයේ,
(1) වාර්ගික කණ්ඩායම්වල ඉල්ලීම ය.
(2) සම්පත් බෙදීයාමේ විෂමතාව ය.
(3) ප්‍රාදේශීය සම්පත්වල උපරිම ප්‍රයෝජනය ගැනීම ය.
(4) කුඩා රාජ්‍යවල පාලන කටයුතු පහසු කර ගැනීම ය.

23. මධ්‍යම ආණ්ඩුවට පමණක් හිමි බලතලයක් වනුයේ,
(1) සැලසුම් කිරීම ය. (2) විදේශ කටයුතු ය.
(3) ජාතික නිවාස හා ඉදිකිරීම ය. (4) කෘෂිකර්ම හා ගොවිජන සේවා ය.

24. ආණ්ඩුවක සුජාතභාවය දක්වෙන අවස්ථාවකි.
(1) අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කිරීම.
(2) මැතිවරණයකදී ජන මාධ්‍ය බහුලව භාවිත කිරීම.
(3) නිදහස් හා සාධාරණ මැතිවරණයක් මගින් බලයට පත් වීම.
(4) ප්‍රාදේශීය සංවර්ධනයට වැඩි අවස්ථාවක් සැලසීම.

25. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් මාධ්‍ය මගින් ඉටු කළ යුතු වැදගත් කාර්යයක් වනුයේ,
(1) පවතින රජය නිතර විවේචනයට ලක් කිරීම ය.
(2) පක්ෂපාතී ලෙස කටයුතු කිරීම ය.
(3) සත්‍ය හා නිවැරදි තොරතුරු ජනතාව වෙත සැපයීම ය.
(4) ජනතාවට විනෝදාස්වාද කටයුතු පමණක් සම්පාදනය කිරීම ය.

26. සන්ධීය ආණ්ඩුක්‍රම පවතින රටවල් පමණක් අයත් පිළිතුර වනුයේ,
(1) ඇ. එ. ජ. , ස්විට්සර්ලන්තය හා ඕස්ට්‍රේලියාවයි.
(2) ඇ. එ. ජ. , ස්විට්සර්ලන්තය හා මහා බ්‍රිතාන්‍යයි.
(3) ඇ. එ. ජ. , ස්විට්සර්ලන්තය හා ප්‍රංශයයි.
(4) ඇ. එ. ජ. , ස්විට්සර්ලන්තය හා ශ්‍රී ලංකාවයි.

27. ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යුහය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශයක් වනුයේ,
(1) ව්‍යවස්ථාදායකය විසින් විධායක බලතල ක්‍රියාත්මක කිරීම ය.
(2) ෆෙඩරල් අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක වීම ය.
(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට මධ්‍යම ආණ්ඩුවේ 2/3 ක බලය පමණක් අවශ්‍ය වීම ය.
(4) ව්‍යවස්ථාදායකය සෙනෙට් සභාව පමණක් වීම ය.

28. "ඇදහිලි, චින්තන ක්‍රම, ව්‍යවහාරික කලා, ජීවන පිළිවෙත්, සිරිත් විරිත්, සම්ප්‍රදායන් හා සමාජයීය වශයෙන් සම්මත කරගත් ක්‍රියා කිරීමේ විධි සංස්කෘතියයි" ලෙස දක්වා ඇත්තේ,

(1) ඒ.ටී. හීලර් ය. (2) ටී.බී. ටයිලර් ය.

(3) චාර්ලස් ඒ. එල්වුඩ් ය. (4) මහාචාර්ය ගානර් ය.

29. ඇමරිකා එක්සත් ජනපදයේ වර්තමාන ප්‍රාන්ත සංඛ්‍යාව වනුයේ,

(1) 13 කි. (2) 25 කි.

(3) 50 කි. (4) 100 කි.

30. මහා සභාව ලෙස හඳුන්වනුයේ,

(1) පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතනයයි.

(2) කැබිනට් මණ්ඩලයයි.

(3) පළාත් ආණ්ඩුකාරවරයාගේ නිල කාර්යාලයයි.

(4) පාර්ලිමේන්තුවයි.

31. සබරගමු පළාතට අයත් දිස්ත්‍රික්කයක් වනුයේ,

(1) මාතලේ දිස්ත්‍රික්කයයි. (2) කුරුණෑගල දිස්ත්‍රික්කයයි.

(3) කළුතර දිස්ත්‍රික්කයයි. (4) කෑගල්ල දිස්ත්‍රික්කයයි.

32. වන්නි දිස්ත්‍රික්කය සඳහා අයත්වන දිස්ත්‍රික්ක නිවැරදිව දක්වා ඇති පිළිතුර වනුයේ,

(1) මන්නාරම, වව්නියාව, කිලිනොච්චිය යන දිස්ත්‍රික්කයන් ය.

(2) වව්නියාව, කිලිනොච්චිය, පුත්තලම යන දිස්ත්‍රික්කයන් ය.

(3) මන්නාරම, වව්නියාව, මුලතිව් යන දිස්ත්‍රික්කයන් ය.

(4) කිලිනොච්චිය, මුලතිව්, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන් ය.

33. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කරගනු ලැබුවේ,

(1) 1948 දෙසැම්බර් 10 දිනයි. (2) 1947 සැප්තැම්බර් 10 දිනයි.

(3) 1950 දෙසැම්බර් 10 දිනයි. (4) 1965 නොවැම්බර් 10 දිනයි

34. යුරෝපයේ බිහිවූ ප්‍රථම ජාතික රාජ්‍යයන් දෙක වනුයේ,

(1) එංගලන්තය හා පෘතුගාලයයි. (2) එංගලන්තය හා ඕලන්දයයි.

(3) ප්‍රංශය හා පෘතුගාලයයි. (4) එංගලන්තය හා ප්‍රංශයයි.

35. අනුරාධපුර යුගය තුළ බලය විමධ්‍යගත කිරීමේ අවස්ථාවක් වනුයේ,

(1) පළාත් මට්ටමේ රෙසිඩන්ට්වරයකු පත් කිරීමයි.

(2) නගර සභා පිහිටුවීමයි.

(3) ගම්බාර, ගාමණී වැනි නිලධාරීන් පත් කිරීමයි.

(4) ප්‍රාදේශීය හා ග්‍රාමෝදය මණ්ඩල ක්‍රියාත්මක කිරීමයි.

36. මිනිසාගේ මූලික අවශ්‍යතාවයක් වනුයේ,

(1) ආහාරයි. (2) ජංගම දුරකථනයයි.

(3) මෝටර් රථයයි. (4) සිසිල් බීමයි.

37. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තුළ සාමකාමී ජන සමාජයක් ගොඩ නැගීමට හේතුවන කරුණක් වනුයේ,

(1) නීතිය පවතින රජයට පක්ෂග්‍රාහිව ක්‍රියා කිරීමයි.

(2) බහුතර මතය අනුව ක්‍රියා කිරීමයි.

(3) තරාතිරම මත අයිතිවාසිකම් වෙනස් වීමයි.

(4) පුරවැසියන්ට අදහස් ප්‍රකාශයට සීමා ඇති කිරීමයි.

38. ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මක ලක්ෂණයක් වනුයේ,

(1) විරුද්ධ මත ඉවසීමයි. (2) විරුද්ධ මතධාරීන් මර්දනය කිරීමයි.

(3) බහුතර මතය නොසලකා කටයුතු කිරීමයි. (4) අයිතිවාසිකම් පමණක් භුක්ති විඳීමයි.

39. පහත "අ" තීරුවේ සඳහන් ප්‍රකාශ "ආ" තීරුවේ ප්‍රකාශ සමඟ නිවැරදිව ගැළපූ විට අදාළ පිළිතුර ඇතුළත් කාණ්ඩය තෝරන්න.

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| 1. රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂමතාව | A. ජනාධිපති ආණ්ඩු ක්‍රමය |
| 2. විධායකය, ව්‍යවස්ථාදායකයට වගකීමට සෘජුව බැඳී නැත. | B. සන්ධීය ආණ්ඩු ක්‍රමය |
| 3. පළාත් අයවැය ලේඛනය සකස් කිරීම | C. යහපාලනයක අවශ්‍යතාව |
| 4. භූමි ප්‍රමාණය විශාල රාජ්‍යවල තීරණ ගැනීම පහසුවීම. | D. මහ ඇමති හා අමාත්‍ය මණ්ඩලය |

(1) A D C B ය. (2) A C D B ය.

(3) C A D B ය. (4) C A B D ය.

40. පහත දක්වෙන කරුණු අතුරින් ජාතික රාජ්‍යයන් බිහිවීමට බලපෑ හේතු ඇතුළත් පිළිතුර තෝරන්න.

A වැඩවසම් ක්‍රමය බිඳ වැටී ධනවාදී ආර්ථිකයක් ගොඩනැගීම.

B පුනරුදය

C කුරුස යුද්ධය

D බදු පැනවීම ඉහළ යාම

(1) A හා C ය. (2) A හා B ය.

(3) B හා D ය. (4) A හා D ය.

| | |
|---|---|
| මීගමුව අධ්‍යාපන කලාපය<br>දෙවන වාර ඇගයීම - 2016<br>පුරවැසි අධ්‍යාපනය I , II | |
| විභාග අංකයඃ ............................................... | |
| 10 ශ්‍රේණිය | II කොටස |

Learning Resource Center

**උපදෙස්**

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 ක් ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01. i. ඈත අතීතයේ පටන් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ලක්ෂණ ක්‍රියාත්මක වූ බවට ඇති සාධක 02ක් ලියා දක්වන්න.

ii. ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයන්ට ඡන්දය භාවිත කිරීමට අවස්ථාව ලැබෙන මැතිවරණ 02ක් නම් කරන්න.

iii. තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ 02ක් ලියන්න.

iv. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ 02ක් ලියන්න.

v. ජාතික රාජ්‍යයක ලක්ෂණ 02ක් ලියන්න.

vi. ජනාධිපති ආණ්ඩුක්‍රමයක විශේෂ ලක්ෂණ 02ක් ලියන්න.

vii. ආණ්ඩුකාරවරයා සතු බලතල 02ක් ලියන්න.

viii. ස්විට්සර්ලන්තය සන්ධීය රාජ්‍යයක් ලෙස ගොඩනැගීමට බලපෑ හේතු 02ක් ලියන්න.

ix. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම සඳහා පිහිටීම බලපා ඇති ආකාර 02ක් ලියන්න.

x. යහපාලනයක තිබිය යුතු මූලික ගුණාංග 02 ක් ලියන්න.

(ල. 2 X 10 = 20 යි)

02. i. වර්තමාන රාජ්‍යයන් තුළ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමට අපහසු වීමට බලපාන හේතු 02 ක් ලියන්න. (ල. 02 යි)

ii. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යයන් 03 ක් ලියා දක්වන්න. (ල. 03 යි)

iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 03 ක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

(කරුණු 3 ට ලකුණු 3 යි.
විස්තරයට ලකුණු 2 යි.)
(මුළු ලකුණු 10)

27.07.2016

10 ශ්‍රේණිය

පුරවැසි අධ්‍යාපනය.

Learning Resource Center
R
... College
Kandana

03. i. රාජ්‍යයක් හා ආණ්ඩුවක් යනුවෙන් අදහස් වන්නේ කුමක් දැයි වෙන් වශයෙන් ලියා දක්වන්න. (ල. 02 යි )

ii. රාජ්‍යයක ප්‍රධාන ස්වරූප 2 ක කෙටියෙන් හඳුන්වන්න. (ල. 03 යි)

iii. ආණ්ඩුවක ප්‍රධාන අවයව (organs) නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

(කරුණු 3 ට ලකුණු 03 යි.
විස්තරයට ලකුණු 02 යි)
මුළු ලකුණු 10

04. i. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු සතු වගකීම් 02 ක් ලියා දක්වන්න. (ල. 02 යි. )

ii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක 03 ක් ලියන්න. (ල. 03 යි)

iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් වැදගත් වන ආකාරය කරුණු 03 ක් යටතේ දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

(කරුණු 3 ට ලකුණු 03 යි.
විස්තරයට ලකුණු 02 යි)
මුළු ලකුණු 10

05. i. බලය විමධ්‍යගත කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ල. 02 යි)

ii. ඒකීය රාජ්‍යයක ලක්ෂණ 03 ක් ලියා දක්වන්න. (ල. 03 යි)

iii. සන්ධීය රාජ්‍යයක ප්‍රවණතා 3 ක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

(කරුණු 3 ට ලකුණු 03 යි.
විස්තරයට ලකුණු 02 යි)
මුළු ලකුණු 10

06. i. ශ්‍රී ලංකාවේ පළාත් සභාවක ආයතනික ව්‍යුහය ලියා දක්වන්න. (ල. 02 යි)

ii. පළාත් ආණ්ඩුකාරවරයා සතු බලතල හා කාර්යයන් 03 ක් ලියා දක්වන්න. (ල. 03 යි)

iii. පළාත් සභාවක් සතු බලතල හා කාර්යයන් 03 ක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

(කරුණු 3 ට ලකුණු 03 යි.
විස්තරයට ලකුණු 02 යි)
මුළු ලකුණු 10

07. i. රටක සංස්කෘතිය තීරණය වීමට බලපාන සාධක 02 ක් ලියන්න. (ල. 02 යි)

ii. බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග 03 ක් ලියා දක්වන්න. (ල. 03 යි)

iii. බහු සංස්කෘතික ජන සමාජයක සමාජිකයන් ලෙස එක්සත් ව ජීවත් වීමේ ජාතික වැදගත්කම කරුණු 03 ක් යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න.

(කරුණු 3 ට ලකුණු 03 යි.
විස්තරයට ලකුණු 02 යි)
මුළු ලකුණු 10